**නාවලපිටිය නගර සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 26 ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නාවලපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ප්‍රයෝජනයට ගත නොහැකි රු.1,830,323 ක් වටිනා භාණ්ඩ අපහරණය කිරීමකින් තොරව ගිණුම්වලින් ඉවත් කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | COVID 19 හේතුවෙන් වෙන්දේසි කිරීමට නොහැකි වූ බව දන්වමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ හිඟහිටි බදුකුලී ආදායම රු.185,188 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | උපලේඛනය නිවැරදි කළ බව දන්වමි. |
| (iii) | සභාව සතු කඩ බදු දීමෙන් ලැබිය යුතු එක්වන් මුදල් රු.3,100,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (iv) | රු.920,000 ක් වටිනා පොදු තැන්පතු ශේෂ 22 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | 2020 ගිණුම් සැකසීමේදී නිවැරදි කරන බව දන්වමි. |
| (v) | රු.6,378,668 ක් වටිනා සංවර්ධන යෝජනා 13 ක් ණයහිමි ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | 2010 සිට පැවතෙන ගැටළුවක් බැවින් සභාව ගන්නා ක්‍රියාමාර්ග අනුව ගිණුම්ගත කරන බව දන්වමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.4,775,867 ක් වූ ගිණුම් ශේෂ 3 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.1,514,695 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වසර 1-5 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.2,785,018 ක් වූ අතර, වසර 5 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂය රු.5,632,723 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගත යුතු වේ. | අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) | වසරක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.2,262,629 ක් වූ අතර වසර 5 ක කාලයක් ඉක්මවූ ශේෂ එකතුව රු.11,845,252 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කරගත යුතු වේ. | ගෙවිය යුතු මුදල් ඉදිරියේදී ගෙවා අවසන් කරන බව දන්වමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.4,116,325 ක් වූ ගිණුම් විෂයයන් 6 කට අදාළව ශේෂ සනාථ කිරීම් හා උපලේඛන යනාදි සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**1.4 අනුකූල නොවීම**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ අංක 36(ඉ) II ඡේදය | | | | |
| | | (i) | ජයතිලක ක්‍රීඩාංගනයට ඇතුළු වන ස්ථානයේ පවත්වාගෙන යන කඩ කාමරය විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව හා තක්සේරු කිරීමකින් තොරව මසකට රු.2,047 ක බිම් කුලියකට බදුදී තිබුණි. | විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන තක්සේරු කර බදු දීමට හෝ සන්තකය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | කඩ කාමරය සඳහා නව තක්සේරුවක් ලබා ගැනීමටත්, අමතරව භාවිතා කරන භූමිය සඳහා බිම් කුලියක් ලබා ගැනීමටත් කටයුතු කරන බව දන්වමි. |
| | | (ii) | විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් හා තක්සේරුවකින් තොරව සමූපකාර සමිතියකට කිරිහලක් පවත්වාගෙන යාමට ඉඩම් කොටසක් බදු දී මසකට රු.1,200 ක මුදලක් අය කර තිබුණි. | විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන තක්සේරු කර බදු දීමට හෝ සන්තකය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2006 අගෝස්තු 21 දින සභාවේ අංක 5:28 දරන තීරණයෙන් පළාත් පාලන අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව බදු දී ඇත. |
| | | (iii) | දොලොස්බාගේ පාරේ පිහිටි අංක 1772 දරන පිඹුරේ පර්චස් 0.61 ක ඉඩම විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව බදු දී තිබුණි. | අනුමැතිය ලබාගෙන තක්සේරු කර බදු අය කිරීමට කටයුතු කළ යුතු වේ. | විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | | මූල්‍ය ප්‍රකාශන සමඟ සභාවේ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ ඉදිරිපත් කරන බව දන්වමි. |
| (ඇ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | | | | |

| | | | | |
|---|---|---|---|---|
| | (i) 5(I) වගන්තිය | සභාව සතු වෙළඳ සංකීර්ණ 5 ක කඩ කාමර කුළී තක්සේරු කර නොතිබුණි. | වසර 5 කට වරක් තක්සේරුගත කුලිය සංශෝධනය කළ යුතු වේ. | තක්සේරුව ඉල්ලා ඇතත් ලැබී නැති බව දන්වමි. කොත්මලේ කඩ කාමරය සඳහා තක්සේරුව ලැබී ඇති බව දන්වමි. |
| | (ii) 1(V) වගන්තිය | චක්‍රලේඛ ප්‍රකාරව රු.1,813,799 එක්වන් මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකවර අයකිරීම චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරවම කළ යුතු වේ. | අවශ්‍ය කටයුතු කරමින් පවතින බව දන්වමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන අත්පොතේ 2:14:1 වගන්තිය | මිල ගණන් කැඳවීමකින් හා තාක්ෂණ කමිටු වාර්තාවකින් තොරව මහජන පුස්තකාලයට දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම, ජයතිලක ක්‍රීඩාංගනයේ පිහිනුම් තටාකය සඳහා රසායන ද්‍රව්‍ය මිලදී ගැනීම, ක්‍රීඩා උපකරණ මිලට ගැනීම, කාර්යාල හැඳුනුම්පත් හා ජල මෝටරයක් මිලට ගැනීම සඳහා රු.940,603 ක ගෙවීම් කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව මිලදී ගැනීම් කළ යුතු වේ. | එකඟ වෙමි. ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කරන බව දන්වමි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.31,259,441 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.44,664,940 ක් විය.

**2.2** **මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවස්ථා 4 කදී ලබාදී තිබූ රු.146,532 ක අත්තිකාරම් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ සඳහා සිහිකැඳවීම් යැවීමටත් විශ්‍රාම වැටුපෙන් පියවා ගැනීමටත්, ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව දන්වමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 13,086,686 | 13,086,686 | 9,036,774 | 12,347,496 | 14,313,751 | 13,101,409 | 10,232,626 | 10,101,074 |
| (ii) | කුලී | 35,040,592 | 39,949,696 | 18,933,388 | 39,153,497 | 23,607,529 | 6,895,236 | 5,697,443 | 2,268,196 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,520,000 | 1,423,260 | 1,373,655 | 49,605 | 1,960,000 | 1,550,889 | 1,564,889 | (14,000) |
| (iv) | වෙනත් ආදායම් | 7,806,000 | 5,577,516 | 2,309,518 | 6,642,592 | 14,227,280 | 30,274,978 | 13,855,845 | 19,545,294 |
| | | 57,453,278 | 60,037,158 | 31,653,335 | 58,193,190 | 54,108,560 | 51,822,512 | 31,350,803 | 31,900,564 |

### 2.3.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ ආයතන 11 කින් අයවිය යුතු හිඟ වරිපනම් බදු ශේෂය රු.5,979,070 ක් විය. | අය කර ගත යුතු වේ. | මෙම මුදල අය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

### 2.3.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වෙළඳ සංකීර්ණ 6 කින් රු.33,026,495 කඩ කුලියක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරුගත බදු කුලිය අය කරගත යුතු වේ. | කඩ කුලී අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වමි. |

### 2.3.4 වෙනත් ආදායම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශයේ ත්‍රීරෝද රථ නැවතුම්පළවලින් රු.2,568,399 ක මුදලක් අයකර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පරීක්ෂාවක් සිදුකර අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

| | | |
|---|---|---|
| (ආ) කසළ මධ්‍යස්ථානයේ පොහොර විකිණීමෙන් ආයතන 2 කින් රු.1,564,540 ක මුදලක් අයකරගෙන නොතිබුණි. | අයකර ගැනීම කඩිනම් කළ යුතු වේ. | මෙම මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.246,500 ක් හා මුද්දර ගාස්තු රු.2,951,800 ක් විය. | අදාළ මුදල් සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අය වෙමින් පවතින බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 5 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | සභාවට ආදායම් උපයාගතහැකි අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා 10 න් 7 ක් සමාලෝචනය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවට යොමුකර ඇති බව දන්වමි. |

(ආ) ප්‍රතිපාදන නොසැලසීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් 07 ක් සඳහා වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන වෙන් නොකිරීම නිසා ඉටුකළ නොහැකි වී තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම ඉටුකිරීමට අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කළ යුතු වේ. | පරීක්ෂා කර වාර්තා කරන බව දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක ප්‍රමාණවත් අයුරින් හඳුනාගෙන නොමැති අතර, එම නිසා ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්යභාරයක් ඉටු කර නොමැත. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු අක්කර 18 රූඩ් 02 ක ප්‍රමාණයේ IDH ඉඩමෙන් අක්කර 10 රූඩ් 03 පර්චස් 17.55 ක ඉඩම් කොටසක් නගර සභා පනතේ 36(ඉ)II වගන්තියට අනුකූල නොවී වසර 50 කට පමණ පෙර වගා කටයුතු සඳහා ලබාදී තිබූ අතර, මෙහි පවුල් සියයක් පමණ නිවාස ඉදිකර පදිංචිව තිබුණි. මෙම ඉඩම 1997 වර්ෂයේ තක්සේරු කර තිබුණ ද, 2019 දෙසැම්බර් දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර අනවසරයෙන් පදිංචි වීමට ඉඩහැර තිබුණි. | සභා සතු ඉඩම් විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන තක්සෙරු කර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙය දිගුකාලීන ගැටළුවකි. මෙම ඉඩම 1997 තක්සෙරු කරන ලද කාලයේම ලබාදී නැත. වක්‍රලේඛ පදනම් කරගෙන අඩු තක්සේරුවක් ලබාගෙන සභාවට මුදලක් අයකර දීමට කටයුතු කරන බව දන්වමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක අතිරික්තතා 21 ක් හා සේවක පුරප්පාඩු 12 ක් විය. | අදාළ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | සේවකයින් බඳවා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | සේවය හැර ගිය, ස්ථාන මාරු හා විශ්‍රාමික නිලධාරීන් 52 දෙනෙකුගෙන් රු.2,080,998 ක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 173 දරන මිනි තියටරය 2011 අගෝස්තු 23 දින පුද්ගලයෙකු වෙත ටෙන්ඩර් කිරීමකින් තොරව දීර්ඝකාලීනව බදු දී තිබුණු අතර, ඇප සුරැකුම් හා එකවර ගෙවීමේ මුදල් රු.500,000 ක් හා මාසික කුලිය රු.284,256 ක් ද අයකර නොතිබුණි. | ඇප සුරැකුම්, එකවර ගෙවීමේ මුදල්, මාසික කුලී හා සියළු අය විය යුතු මුදල් අයකර ගත යුතු වේ. | සභාවට ගෙවා ඇති ලක්ෂ 37 ක මුදල සඳහා නව තක්සේරුවක් ලබාදෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා යවා ඇති බව දන්වමි. සභාවට අයවීමට ඇත්තේ රු.500,000 ක හිඟයක් බව වාර්තා කරමි. |
| (ආ) | සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමරවල නව තක්සේරුව ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රු.32,675,828 ක කඩ කුළී ආදායමක් අහිමි වී තිබුණි. | නව තක්සේරුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | 2008 වර්ෂයේ වරිපනම් තක්සේරුව මත 2019 වර්ෂය දක්වාම වරිපනම් අය කර තිබුණි. | වරිපනම් වර්ෂ 5 න් 5 ට තක්සේරු කිරීම කළ යුතු වේ. | තක්සේරුව ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 2 ක් හා නිවාස 3 ක් වසා දමා තිබුණි. | සභාව සතු වත්කම් ප්‍රයෝජනයට ගෙන ආදායම් උත්පාදනය කරගත යුතු වේ. | නිවාස 2 ක් මුද්‍රා තබා ඇති අතර, ටෙන්ඩර් කළද ගැනුම්කරුවකු ඉදිරිපත් නොවීය. කඩ කාමර 3 ක් ගැනුම්කරුවන්ගේ ඉල්ලීම මත ලබාදී ඇති බව දන්වමි. |

### 3.5.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නාවලපිටිය ක්‍රීඩාංගනයේ වර්ග අඩි 600 ක් පමණ වූ ගොඩනැගිල්ල ප්‍රයෝජනයට නොගෙන පරණ භාණ්ඩ දමා තිබුණි. | වත්කම් උපයෝජනය කළ යුතු වේ. | මෙම ගොඩනැගිල්ල මහල් තුනකට සාදා පෙර පාසැලකට හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයටක දීමට බලාපොරොත්තු වන බව දන්වමි. |

**3.6** **ප්‍රසම්පාදනය**

**----------------**

**ප්‍රසම්පාදන සැලැස්ම**

**-------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ------------ | ----------------------------- |
| සමාලෝචිත වර්ෂයේදී රු.19,973,949 ක මුදලකට ප්‍රසම්පාදනය සිදුකර ඇතත්, ප්‍රසම්පාදන සැලැස්මක් විගණනයට ඉදිරිපත් නොවුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ප්‍රසම්පාදනයට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |